කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
DEPARTMENT OF METEOROLOGY

බෞද්ධාලෝක මාවත, කොළඹ 07. ශ්‍රී ලංකාව
BAUDDHALOKA MAWATHA. COLOMBO 07. SRI LANKA

TELEPHONE (+94) 0112-694846/7 E-mail - agromet12@yahoo.com Web Site – http://www.meteo.gov.lk

AGROMETEOROLOGICAL DIVISION / කෘෂි කාලගුණ අංශය

Agrometeorological Bulletin (For 04th week)

කෘෂි කාලගුණ තොරතුරු ප්‍රකාශය (04 වන සතිය සඳහා)

(2017.01.22 - 2017.01.28)

ඇතුළත

පසුගිය සතිය තුල පැවති කාලගුණ තත්ත්වය

- වර්ෂාපතන තත්ත්වය
- උෂ්ණත්ව තත්ත්වයන්
- පාංශු ජලය
- කෘෂි කාලගුණ පරාමිතීන්හි සති සාමාන්‍යයන්

ඉදිරි සතිය සඳහා කාලගුණ අනාවැකිය

- දෛනික වර්ෂාපතන අනාවැකිය
- Weekly Outlook

ඉදිරි දින 20 සඳහා පස් දින කාලය (Pentad) තුළ ලැබිය හැකි වර්ෂාපතන අගයන් සඳහා සාමාන්‍ය අගයෙන් වෙනස්වීම පිළිබඳ අනාවැකිය

(Rainfall and Rainfall Anomaly)

නිකුත් කළ දිනය 2017-01-23

පසුගිය සතිය තුළ පැවතුන කාලගුණය

● පසුගිය සතිය තුල පැවතුන වර්ෂාපතන තත්ත්වයන්

03 වන සතිය (2017-01-15 සිට 2017-01-21 දක්වා) තුල දී සතියේ අගකොටස වනවිට දැඩි වියළි කාලගුණ තත්ත්වය අවසන් කරමින් තද වැසි දිවයිනේ බොහෝ ප්‍රදේශ වලින් වාර්තා විය. එහිදී විශේෂයෙන්ම දිවයිනේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ වලදී තරමක් තද වැසි පැවතුණි.
දිනකදී ලද උපරිම වර්ෂාපතන අගයන් පහත දැක්වේ.

දිනය	වර්ෂාපතන ප්‍රමාණය (මි.මී)	ප්‍රදේශය
2017-01-15	0.4	වව්නියාව
2017-01-16	18.0	පල්ලේගම (ගාල්ල)
2017-01-17	0.0	-
2017-01-18	1.5	සංගමම් වැව (නැගෙනහිර)
2017-01-19	11.8	ත්‍රිකුණාමලය
2017-01-20	62.5	අරලගංවිල
2017-01-21	94.2	වාකරෙයි

1 රූප සටහන මගින් 2017 ජනවාරි මුල සිට මේ දක්වා සාමාන්‍ය වර්ෂාපතන අගයට වඩා වර්ෂාපතන අගය වෙනස්වීම ප්‍රතිශතයක් ලෙස පෙන්වා ඇති අතර, 03 වන සතිය තුල ලැබුණු වර්ෂාපතන අගයන් එම සතිය තුල සාමාන්‍ය වර්ෂාපතන අගයන්ට අමතර ප්‍රතිශතයක් ලෙස 2 රූප සටහන මගින් පෙන්වා ඇත. ඒ අනුව,
වසරේ මුල සිට මේ දක්වා වර්ෂාපතන අගයන් එම කාලය තුල ලැබූ වාර්ෂික සාමාන්‍යය අගයන් සමඟ සැසඳීමේදී (1 රූපය) යාපනය, මන්නාරම, වව්නියාව, මාතලේ සහ අම්පාර යන දිස්ත්‍රික්ක වල 40%-50% අතර සහ සෙසු ප්‍රදේශවලදී 70%-100% අතර අඩුවීමක් දැකිය හැක.

03 වන සතියේ වර්ෂාපතන අගයන් සති සාමාන්‍යය අගයන් සමඟ සැසඳීමේ දී, (2 රූපය) මන්නාරම, වව්නියාව, යාපනය යන දිස්ත්‍රික්ක වල 100% ක සහ මාතලේ දිස්ත්‍රික්කයේ 50% ක පමණ වැඩිවීමක් ද, අම්පාර දිස්ත්‍රික්කයේ 100% ක සහ හම්බන්තොට, ගාල්ල, ගම්පහ යන දිස්ත්‍රික්ක වල 90% ක පමණ අඩුවීමක් ද දැකිය හැක.



1 රූප සටහන



2 රූප සටහන

● <u>03 සතිය (ජනවාරි 15 සිට ජනවාරි 21) තුල උෂ්ණත්ව තත්වයන්</u>

03 වන සතිය තුළ උපරිම උෂ්ණත්ව අගයන් එම කාලය තුල සාමාන්‍යය අගයන් සමග සැසදීමේදී, හම්බන්තොට ප්‍රදේශයේ දින 06 ක් පුත්තලම ප්‍රදේශයේ දින 05 ක් ත්‍රිකුණාමලය, කටුනායක ප්‍රදේශවල දින 04 ක් සෙල්සියස් අංශක 2 ක පමණ වැඩිවීමක් ද, නුවර එළිය, මන්නාරම, මහ ඉලුප්පල්ලම, අනුරාධපුර ප්‍රදේශවල දින 01 ක් සෙල්සියස් අංශක 2-3 අතර අඩුවීමක් ද වාර්තා විය. උපරිම උෂ්ණත්වයේ ඉහළම වැඩිවීම සෙල්සියස් අංශක 3.5 ක් ලෙස ජනවාරි 21 දින ගාල්ල ප්‍රදේශයෙන් ද උපරිම උෂ්ණත්වයේ පහලම අඩුවීම සෙල්සියස් අංශක 3.6 ක් ලෙස ජනවාරි 20 දින කුරුණෑගල ප්‍රදේශයෙන් ද වාර්තා විය.

අවම උෂ්ණත්ව අගයන් එම කාලය තුල සාමාන්‍ය අවම උෂ්ණත්ව අගයන් සමග සැසදීමේදී, කොළඹ ප්‍රදේශයේ දින 04 ක් රත්මලාන, කටුනායක ප්‍රදේශවල දින 03 ක් පුත්තලම, නුවර එළිය, කටුගස්තොට, හම්බන්තොට බණ්ඩාරවෙල, අනුරාධපුර ප්‍රදේශවල දින 02 ක් සෙල්සියස් අංශක 2-5 අතර වැඩිවීමක් ද වව්නියාව, නුවර එළිය, කටුගස්තොට, යාපනය ප්‍රදේශවල දින 03 ක් අනුරාධපුර, බණ්ඩාරවෙල, රත්නපුර ප්‍රදේශවල දින 02 ක් සෙල්සියස් අංශක 2-3 අතර අඩුවීමක් ද වාර්තා විය. අවම උෂ්ණත්වයේ ඉහළම වැඩිවීම සෙල්සියස් අංශක 5.5 ක් ලෙස ජනවාරි 21 දින කටුගස්තොට ප්‍රදේශයෙන් ද අවම උෂ්ණත්වයේ පහලම අඩුවීම ජනවාරි 18 දින සෙල්සියස් අංශක 4.9 ක් ලෙස නුවර එළිය ප්‍රදේශයෙන් ද වාර්තා විය.

3 රූප සටහන මගින් 03 සතියේ සාමාන්‍යය උපරිම උෂ්ණත්වය සති සාමාන්‍යය (30 year Average) සමග ඇති වෙනස නිරූපණය වන අතර 03 සතියේ සාමාන්‍යය අවම උෂ්ණත්වය සති සාමාන්‍යය (30 year Average) සමග ඇති වෙනස 4 රූප සටහන මගින් දැක්වේ.



3 රූප සටහන

(උපරිම උෂ්ණත්වය සති සාමාන්‍යය සමග ඇති වෙනස)



4 රූප සටහන

(අවම උෂ්ණත්වය සති සාමාන්‍යය සමග ඇති වෙනස)

● පොළව තුල එක් එක් මට්ටම් වල පැවති පාංශු ජල ප්‍රමාණයයන්

පොළව තුල එක් එක් මට්ටම් වල පාංශු ජල ප්‍රමාණයයන් පහත රූප සටහන් වලින් පෙන්නුම් කරනු ලැබේ.

රූප සටහන 5,6 සහ 7 මගින් පිලිවෙලින්, පොළව තුල එක් එක් මට්ටම් වල පැවති පාංශු ජල ප්‍රමාණයන් ප්‍රතිශතයක් ලෙස දක්වා ඇත.

රූප සටහන 5, 0-10 සෙ.මී.

රූප සටහන 6, 0-40 සෙ.මී.

රූප සටහන 7, 40-100 සෙ.මී.



රූප සටහන 5 පාංශු ජලය 0-10 සෙ.මී.



රූප සටහන 6 පාංශු ජලය 10-40 සෙ.මී.



රූප සටහන 7 පාංශු ජලය 40-100 සෙ.මී.

● කෘෂි කාලගුණ තත්වය පිළිබඳ සති සාමාන්‍යයන්



වාෂ්පීභවනය (evaporation)



වර්ෂාපතනය



සාපේක්ෂ ආර්ද්‍රතාව 0830



සාපේක්ෂ ආර්ද්‍රතාව 1530



උපරිම උෂ්ණත්වය



අවම උෂ්ණත්වය



සූර්ය දීප්ත පැය ගණන

ඉදිරි සතිය සඳහා කාලගුණ අනාවැකිය

- *ජනවාරි 22 සිට ජනවාරි 29 දක්වා දෛනික වර්ෂාපතන අනාවැකිය (WRF ආකෘතිය)*



2017-01-22 සිට 2017-01-23 දක්වා



2017-01-23 සිට 2017-01-24 දක්වා



2017-01-24 සිට 2017-01-25 දක්වා



2017-01-25 සිට 2017-01-26 දක්වා



2017-01-26 සිට 2017-01-27 දක්වා



2017-01-27 සිට 2017-01-28 දක්වා



2017-01-28 සිට 2017-01-29 දක්වා



2017-01-29 සිට 2017-01-30 දක්වා

ඉදිරි සතිය සඳහා කාලගුණ අනාවැකිය

- ***ජනවාරි 23 සිට ජනවාරි 29 දක්වා වර්ෂාපතන අනාවැකිය***

දිවයින අවට වායුගෝලයෙහි තරංග ආකාරයේ කැළඹිලි ස්වභාවයක් නිසා 23 සහ 24 යන දිනයන්හිදී, වර්ෂාපතනයේ ඉහළ වැඩිවීමක් ද (විශේෂයෙන්ම නැගෙනහිර පලාත් වලදී) 25,26 වනවිට එහි තරමක අඩුවීමක් ද 27,28 වනවිට නැවත වැඩිවීමක් සිදුවන අතර එය 23,24 දිනවල පැවතුණු තත්ත්වය තරම් ප්‍රබල නොවෙනු ඇත.

- ***ඉදිරි දින 20 සඳහා පස් දින (Pentad) කාලයෙන් තුළ ලැබිය හැකි වර්ෂාපතන අගයන් (එක් දිනකට මි.මී./mm per day) සහ සාමාන්‍ය අගයන්ගෙන් වෙනස්වීම (Rainfall Anomaly) (එක් දිනකට මි.මී./mm per day) සඳහා වන අනාවැකිය***



Source: Indian Institute of Tropical Meteorology, CFSv2 model forecasts